# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1996 අංක 6 දරන
## මුද්දර ගාස්තු
## (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1996 මාර්තු මස 25 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1996 මාර්තු මස 29 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ගත හැකිය.

මිල : ශත 45 යි. තැපැල් ගාස්තුව : රු. 2.00 යි.

# 1996 අංක 6 දරන මුද්දර ගාස්තු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1996 මාර්තු මස 25 වන දින.]

එල්. ඩී.—ඕ. 64/95

## 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 1996 අංක 6 දරන මුද්දර ගාස්තු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *(ලුහුඬු නාමය.)*

**2.** 1993 අංක 63 දරන පනතින් අවසන් වරට සංශෝධිත, (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනතේ 5 වන වගන්තියේ (23) වන ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අළුත් ඡේද එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:— *(1982 අංක 43 දරන පනතේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.)*

"(24) ණය සුරැකුම්පතක් පැවරීම සඳහා ලියා අත්සන් කරන ලද සාධන පත්‍රය ;

(25) ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනතේ අර්ථය ඇතුළත වූ ලියාපදිංචි කළ සමුපකාර සමිතියක් විසින් හෝ ඒ වෙනුවෙන් හෝ එහි වාසියට ලියා අත්සන් කරන ලද සාධන පත්‍රය හෝ ඒ පනතේ 59 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අධිකරණයක ගොනු කරන ලද ලේඛනය ; සහ

(26) ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනතේ අර්ථය ඇතුළත වූ ලියාපදිංචි කළ සමුපකාර සමිතියක සාමාජිකයකු විසින්, ඒ ලියාපදිංචි කළ සමිතියේ වාසියට සහ එහි ව්‍යාපාරයට අදාළව ලියා අත්සන් කරන ලද සාධන පත්‍රය.".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 70 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. *(ප්‍රධාන ප්‍රඥප්තියේ 70 වන වගන්තිය සංශෝධනය කිරීම.)*

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තියේ "ණය පත් සමාගම" යන පාඨයේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අළුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— *(ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තිය සංශෝධනය කිරීම.)*

"ණය සුරැකුම්පත" යන්නෙන් ලැයිස්තුගත පොදු සමාගමක බැඳීමක් ඇති කරන්නාවූ, ලේඛනගත කරන්නා වූ හෝ පිළි

ශත්තා වූ ද, 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ යම් බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක දී විනිමය කළ හැකි හෝ පැවරිය හැකි වූ ද, යම් බැඳුම්කරයක්, නෝට්ටුවක්, සාක්ෂි පත්‍රයක්, ණය මුදලක්, ව්‍යාපාර වස්තුවක් හෝ වෙනත් සුරැකුම්පතක් හෝ සාධන පත්‍රයක් අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත් විය යුතු බව.

5. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.